දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

බුද්ධ චරිතය

09 වන පාඩම ; ධර්ම ප්‍රචාරක කටයුතු හා බුදු සසුනේ ව්‍යාප්තිය

[[2018/2019]] 06 වන ප්‍රශ්නය

I -

II බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව, එය සිදු කළ රජතුමා, පාලන රාජධානිය හා එහි අගනගරය ලියා දක්වන්න.

III බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව සිදු කළ රජතුමා එදින රාත්‍රියේ හඬා වැළපෙන නිරුවත් ප්‍රේතයන් සිහිනෙන් දැකීමට හේතු හා ඔවුන් සුවපත් කිරීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග විස්තර කරන්න.

IV බුදු සසුනේ දානය දායක පක්ෂයෙහි චිත්ත පාරිශුද්ධිය සඳහා හේතුවන ආකාරය කුසල මූල සංකල්පයට අනුව සාකච්ඡා කරන්න.

[[2017/2018]] 06 වන ප්‍රශ්නය

I –

II බුදුරදුන්ගේ කිඹුල්වත් පුර චාරිකාවෙහි විශේෂ සිද්ධි හතරක් ඉදිරිපත් කරන්න.

III බුදු සසුනේ පළමු රහත් හැට නම අමතා දේශනා කළ ප්‍රථම ධර්ම ප්‍රචාරක අවවාදය හා එහි අදහස ලියා දක්වන්න.

[[2015/2016]] 06 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ කිඹුල්වත්පුර චාරිකාවේදී දේශනා කළ ජාතක හා වෙනත් ධර්ම දේශනා හතරක් ගෙනහැර දක්වන්න.

II කිඹුල්වත්පුර භික්ෂු සංඝයා පිරිවරාගෙන පිඬුසිඟා වඩින බුදුරදුන් දුටු සුද්ධෝදන රජු විසින් කරනු ලැබූ ආයාචනය හා ඊට බුදුරදුන් ලබා දුන් පිළිතුරු ලියා දක්වන්න.

III බුදුරදුන්ගේ අටලෝ දහමින් කම්පා නොවීමේ තාදී ගුණය ප්‍රකට කළ අවශ්‍යතා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

IV බුදුරදුන් තුළ පැවති තාදී ගුණයෙන් වර්ථමාන ලෝකයා හට ගත හැකි ජීවිතාදර්ශ සාකච්ඡා කරන්න.

[[2014/2015]] 04 වන ප්‍රශ්නය

I –

II –

III –

IV ශාක්‍යයන්ගේ මානය බිඳකෙළීම සඳහා බුදුරදුන් අනුගමනය කළ ක්‍රියා මාර්ග පැහැදිලි කරන්න.

06 වන ප්‍රශ්නය

I –

II භද්දවග්ගිය කුමාරවරුන්ට බුදුරදුන් දේශනා කළ ධර්මය කෙටියෙන් දක්වන්න.

III කෝලිත- උපතිස්ස දෙදෙනා බුදුරදුන් සොයා පැමිණි ආකාරය පැහැදිලි කරන්න.

IV පළමු ධර්ම ප්‍රචාරය බුදුසසුනේ ශීඝ්‍ර ව්‍යාප්තිය කෙරෙහි බලපෑ අයුරු විස්තර කරන්න.

[[2013/2014]] 06 වන ප්‍රශ්නය

I –

II පළමු රහත් හැට නම අමතා බුදුරදුන් කළ අනුශාසනය පැහැදිලි කරන්න.

III බුදුරදුන් තුන් බෑ ජටිලයන් දමනය කළ ආකාරය විස්තර කරන්න.

07 වන ප්‍රශ්නය

I –

II බුදුරදුන්ගේ කිඹුල්වත්පුර චාරිකාවේ ප්‍රයෝජන හතරක් දක්වන්න.

[[2012/2013]] 06 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක දෙනම නම් කොට, උන් වහන්සේලාගේ ගිහි නම් ද සඳහන් කරන්න.

II බුදුරජාණන් වහන්සේ බිම්බිසාර රජු වෙත වැඩම කළ විට ප්‍රාර්ථනා පහක් ඉටුවිණැයි රජතුමා පැවසීය.ඉන් හතරක් ලියන්න.

III අග්‍ර ශ්‍රාවක දෙනම බුදු සසුනේ පැවිදිවීම පිළිබඳව විස්තරයක් කරන්න.

IV බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව පිළිබඳ විස්තරයක් කරන්න.

07 වන ප්‍රශ්නය

I බුදුරදුන් යමාමහ පෙරහැර පෑ අවශ්ථා දෙකක් නම් කරන්න.
II යශෝදරා දේවියට දේශනා කළ ජාතක කථාව නම් කරන්න.
III කිඹුල්වත් පුරයේදී බුදුරදුන් මුල් කොට ගෙන සිදුවූ සිදුවීම් හයක් විස්තර කරන්න.
IV සුද්ධෝදන රජතුමා සෝවාන් වීම හා අනාගාමී වීමේ පුවත් විස්තර කරන්න.

[[2011/2012]] 06 වන ප්‍රශ්නය

I බුදුරදුන් දෙවන වරට ලක්දිවට වැඩම කළේ කිනම් පෝය දිනයක කවර කරුණක් සඳහාද?
II භික්ෂූන් වහන්සේලා විසින් ලාභ ප්‍රයෝජන සඳහා ප්‍රාතිහාර්ය නොදැක්විය යුතු යැ'යි ප්‍රකාශ කිරීමට තුඩු දුන් සිදුවීම පැහැදිලි කරන්න.
III ප්‍රථම,ද්විතීය, තෘතීය වශයෙන් යමක මහා ප්‍රාතිහාර්ය දැක්වූ අවශ්ථා තුන නම් කර ඒ කිනම් අරමුණු සඳහා දැයි කෙටියෙන් දක්වන්න.
IV බුදු සිරිතෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ දෙකක් ගෙනහැර දක්වා ඒවා තම ජීවිතය ආලෝකවත් කර ගැනීම සඳහා යොදාගත හැකි ආකාරය විස්තර කරන්න.

[[2010/2011]] 05 වන ප්‍රශ්නය

I සුද්ධෝදන රජතුමා බුදුරදුන් කිඹුල්වත් නුවරට වැඩම වීම සඳහා අවසාන වරට යවන ලද දූතයා කවරෙක්ද? ඒ කීවෙනි වරටද,බුදුරදුන් කිනම් ආරාමයක වැඩ සිටිද්දීද?
II බුදුරදුන් කිඹුල්වත් නුවරට වැඩම කළේ කිනම් පෝ දිනකද? එහි වැඩම කොට වැඩ සිටියේ කිනම් උද්‍යානයකද? ඒ නුවරදී පෑ ප්‍රාතිහාර්ය කුමක්ද? එම ප්‍රාතිහාර්ය පාන ලද්දේ කවර අරමුණක් ඉටුකර ගැනීමටද?
III කිඹුල්වත් නුවරදී සිදුවූ බුදු සිරිතට සම්බන්ධ සිදුවීම් විස්තර කරන්න.

[[2007/2008]] 06 වන ප්‍රශ්නය

I –
II –
III ප්‍රථම ධර්මදූත සේවාව සඳහා පිරිස් පිටත් කර හැරීමෙන් පසු සේනානිගම ,උරුවෙල් දනවුව ,ලක්දිව හා රජගහනුවර සිදුවූ බුද්ධ චරිතය හා සම්බන්ධ සිදුවීම් කෙටියෙන් දක්වන්න.
IV බුදුරදුන් කිඹුල්වතට වැඩමවීමේ පුවත හා එහිදී ඇතිවූ සිදුවීම් විස්තර කරන්න.

[[2006/2007]] 06 වන ප්‍රශ්නය

I බුදුරදුන් ධර්මදූත සේවාව සඳහා යෙදවූ ප්‍රථම ධර්ම දූතයන් හැට දෙනා නම් කරන්න.

II ධර්මදූත සේවාවට පිටත්වීමට පෙර බුදුරදුන් ධර්ම දූතයන්ට දුන් අවවාදය සඳහන් කොට එම අවවාදයේ අගය පහදන්න.

III කෝලිත- උපතිස්ස දෙදෙනාගේ පුවත විස්තර කොට අස්සජි හිමියන් ඔවුන්ට තථාගත ධර්මය සැකෙවින් පැවසූ ගාථාව ලියා දක්වා එහි අදහස පහදන්න.

[[[2004]]] 06 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ දෙවෙනි ලංකා ගමනේදී වදාළ ජාතක දේශනා හතරක් නම් කරන්න.

II තෙවෙනි ලංකා ගමනේදී බුදුරදුන් වැඩ සිටි ස්ථාන තුනක් හඳුන්වන්න.

[[[1997]]] 09 වෙනි ප්‍රශ්නය

උරුවෙලාදී කාශ්‍යප සොහොයුරන්ට සත්‍යය අවබෝධ කරවනු සඳහා බුදුරදුන් අනුගමනය කළ ක්‍රියාවලියෙහි සාර්ථකත්වය අගයන්න.

විල්වල ස්ථාවරාම බුදුරජාණන් වහන්සේ